


මගේ පස් හැවිරිදි දියණිය, මිණි, නොදොඩා සිටින්නට දන්නේම නැති කෙල්ලකි. ඇගේ දිවියේ විනාඩියක් වත් නිහඬ ව ගත කර අපතේ යවා නැති බව මම නම් තදින් විශ්වාස කරමි. ඇගේ මව මේ ගැන කේන්ති ගෙන ඒ දෙඩවිලි නවතාලන්නට වෙහෙ සුණත්, මා නම් කිසිවිටකවත් එසේ කළේ නැත. මිණි නිහඬව සිටිනු දැකීම අසාමාන්‍ය දසුනක් වූ අතර මට එය දරාගනු බැරි දෙයක් විය. ඉතින් මාත් ඈ හා නිරතුරුවම රස කතාබහේ යෙදුණි.

ඇතැම්විට සිදුවූයේ මෙවැන්නකි. මගේ අලුත්ම නවකතා පොතේ දාහත්වන පරිච්ජේදය ලියමින් සිටිනා වෙලාවක, මිණි හෙරක මෙන් රහසේම කාමරයට විත් මගේ අත අල්ලා ගෙන මෙසේ කියන්නීය.

"තාත්තා! රාම් දයාල් දොරටු පාලකයා කපුටා කියලා කියන්නේ වැරදියට! එයා මුකුත් දන්නේ නැහැ නේද?"

මා ඈට ලෝකයේ ඇති භාෂාවල වෙනස්කම් ගැන පැහැදිලි කරන්නට තැත් කරද්දීම ඈ වෙනම මාතෘකාවක් පටන්ගෙන අවසන් ය.

"හෝලා කියනවා අහසේ අලියෙක් ඉඳගෙන උගේ හොඬවැලෙන් වතුර විදින එකලු අපිට වහිනවා වගේ පේන්නේ! ඇත්තද තාත්තා?" ඊට ගැලපෙන පිළිතුරක් මා ගොනු කරද්දී ඇගේ කතා වෙනත් දෙසකට දිවගොස් හමාර ය.

"තාත්තා! අම්මාගෙයි ඔයාගෙයි මොකක්ද තියෙන නෑකම?"

ඉතා අමාරුවෙන් සිනාව වළක්වා ගන්නා මා "මිණි! ගිහින් හෝලා එක්ක සෙල්ලම් කරන්න" මම වැඩක්!, කියාගන්නට සමත් වේ.

මගේ කාමරයේ කවුළුවට මහපාර හොඳින් දිස් විය. දිනක් දැරිය මේසය අසල බිම මගේ දෙපා කිට්ටුවෙන් සෙල්ලම් කරමින් උන්නා ය. මගේ පොතේ දාහත් වන පරිච්ජේදය ලියා නිම කරන්නට මම වෙහෙසෙමින් සිටියෙමි. ඒ කතාවේ වීරයා වූ ප්‍රතාප් සිං, වීරවරිය වූ කාංචනලතා ව බදා වැළඳගෙන මාලිගාවේ තුන්වෙනි මහලේ කවුළුවකින් පනින්නට සූදානම් වූවා පමණයි, මිණි කෑ ගසමින් කවුළුව අසලට දිව ගියා ය.

"කාබුල් වෙළෙන්දෙක්, කාබුල් වෙළෙන්දෙක්!" ඈ කෑ ගෑවා ය.

ඈ කී පරිදිම කාබුල් සිට පැමිණි වෙළෙන් දෙක් මහමඟ ගමන් කරමින් සිටියේ ය. ඔහුගේ උපන්බිම වැසියන් පළඳින ආකාරයේ බුරුල් කිළුටු ඇඳුමක් ඔහු ඇඳ සිටි අතර හිසේ කුඩා තලප්පාවක් ද විය. ඔහු පිටේ මල්ලක් එල්ලාගෙන සිටි අතර අතේ මිදි පිරවූ පෙට්ටියක් විය.

දියණිය ඔහුට හඬගැසුවේ කුමන අදහසකින්දැයි මා නොදැන සිටි නමුත් එය අසා .දාහත්වන පරිච්ජේදය ලියලා හමාරයි!. කියා නම් මට සිතිනි. දැරිය දුටු වෙළෙන්දා අපගේ ගෙවත්ත වෙත හැරුණු මොහොතේම දැරිය බියෙන් ත්‍රස්ත වී මව වෙත ගොස් සැඟවුනා ය. හැඩි දැඩි මිනිසා අත වූ මල්ලේ ඈ වැනිම ළමයින් තව කීප දෙනෙක් ඇති බවට අන්ධ විශ්වාසයක් මිණි හට තිබූ බව පෙනිණි. ඒ අතරවාරයේ වෙළෙන්දා සිනාසෙමින් මා අභියස සිටගෙන සිටියේ ය.

මගේ පොතේ වීරයාත් වීරවරියත් පසු වූ අඩමාන අවස්ථාව සලකා කුමක් හෝ මිළ දී ගෙන මොහුව යවා දමන්නට මට හදිසි ආවේගයක් ඇති විය. එහෙත් මා ඔහුගෙන් සුළු දේවල් කිහිපයක් මිළදී ගනිද්දී අබ්දුල් රහමාන් ගැන, රුසියානුවන් ගැන, ඉංග්‍රීසින් ගැන, දේශසීමා ප්‍රතිපත්ති ගැන අප අතරේ කතාබහක් ඇති විය.

යන්නට පිටත් වෙද්දී "පුංචි බේබි කෝ සර්?" යැයි ඔහු විමසී ය.

මිණි ගේ සිතේ මේ මිනිසා ගැන පැලපදියම් ව ඇති බොරු බිය තුරන් කළ යුතු බව සිතූ මම ඇය ව පිටතට කැඳවාගෙන ආවෙමි. ඇය මගේ පුටුව අසල සිටගෙන කාබුල් වෙළෙන්දාත් ඔහුගේ මල්ලත් දෙස බලා සිටියා ය. ඔහු ඇයට වියළි මිදි සහ කජු පියලි අහුරක් දුන් නමුත් ඈ එය පිළිනොගෙන මා වෙතම ඇලී සිටියේ වැඩුණු සැකයෙනි.

ඒ ඔවුන්ගේ පළමු හමුවීමයි.

ඊට දින කිහිපයකට පසු උදෑසනක නිවසින් පිටවෙද්දී මිණි දොරකඩ අසල බංකුවක හිඳ ඇගේ දෙපා අසල වාඩිගෙන සිටි කාබුල් වෙළෙන්දා සමඟ ඉතා සතුටින් කතා බහක යෙදෙනු දැක මම ඉමහත් පුදුමයට පත් වුණෙමි. තාත්තාට අමතරව තමන්ට මෙලෙසින් ඉවසිල්ලෙන් සවන් දෙන වෙන කිසිවෙක් දියණියට පෙර කිසිදිනක ලැබී තිබුණේ නැත. ඒ වෙද්දීත් අමුත්තා ඇයට තෑගි කළ ආමන්ඩ් ඇට සහ වියළි මිදි වලින් ඇගේ පුංචි ඇඟලුමේ කෙළවරක් පිරී තිබිණි. "මොකටද එයාට මේවා දුන්නේ?" විමසමින් මා ඔහුට ඒ වෙනුවෙන් ශත අටක් දුන් විට ඔහු විරෝධයක් නොපා ම එය ගෙන සිය සාක්කුවේ රුවා ගත්තේ ය.

එහෙත් මා ඉන් පැයකට පමණ පසු නැවත නිවසට එද්දී ඒ අවාසනාවන්ත කාසිය එහි වටිනාකමෙන් දෙගුණයකටත් වඩා වැඩි තරමේ කලබැගෑනියක් සිදු කර තිබිණි. වෙළෙන්දා මා දුන් කාසිය මිණි හට දී තිබුණු අතර එය ඇය අත දිලිසෙමින් තිබියදී ඇගේ මවට හසු වී තිබිණි.

"ඔයාට කොහෙන්ද ඔය සල්ලි?" අම්මා සැකයෙන් ඇගෙන් විමසා ඇත.
"මට කාබුල් වෙළෙන්දා දුන්නේ" මිණි සතුටින් පිළිතුරු දී ඇත
"කාබුල් වෙළෙන්දා දුන්නා! අනේ මිණි ඔයා මොකටද ඒක එයාගෙන් ගත්තේ?" අම්මා කම්පාවෙන් කෑ ගසා ඇත.

එවෙලේ නිවසට ආ මාහට මිණි ට සිදු වන්නට නියමිත ව තිබුණු ව්‍යසනයෙන් ඈ ව ගලවා ගන්නට හැකි විය. මඳක් ප්‍රශ්න කිරීමෙන් පසු මට මේ මිතුරුකමේ සැබෑ තතු අනාවරණය විය. ඒ, ඔවුන් දෙදෙනා මුණගැසුණු පළමු හෝ දෙවෙනි අවස්ථාව නොවන බවත්, නිරන්තරයෙන් ආමන්ඩ් ඇට සහ වෙනත් රසකැවිලි අල්ලස් දී දැරිය තමන් වෙත ඇති අධික බිය මඟහරවා ගැනීමට වෙළෙන්දා සමත් වී ඇති බවත්, දැන් ඒ දෙදෙනා හොඳ යහළුවන් බවත් මට සොයාගනු හැකි විය.



මේ දෙදෙනාට ම වෙන් වූ අපූරු විහිලු රැසක් තිබුණු අතර දෙදෙනාම ඉන් මහත් විනෝදයක් ලැබූ හ. උස මහත මිනිසා අබියස හිඳ සිටින මිණි ඉතාමත් කුඩාවට, එහෙත් බෙහෙවින්ම උදාර ව දිස් විය. ඈ කැකිරි පලමින් ඔහුගෙන් ප්‍රශ්න අසන්නට පටන් ගනී.

"කාබුල් වෙළෙන්දා, කාබුල් වෙළෙන්දා.. මොනවාද ඔය මල්ලේ තියෙන්නේ?"

"අලියෙක්!" ඔහු කළුකර වැසියන්ගේ නාසික හඬින් පිළිතුරු දේ.

බැලූ බැල්මට මෙහි මහා හාස්‍යයක් නොතිබුණත් ඒ දෙදෙනා නම් ඉන් මහත් සතුටක් ලැබූ බව පෙනිණි. එය අසා සිටි මටත් කුඩා දරුවෙක් වැඩිහිටියෙක් හා සමඟ කරන කතාබහේ අමුතු චිත්තාකර්ෂණීය බවක් දැනිණි.

තමන්ගේ වාරය පැමිණි විට වෙළෙන්දා ත් නොදෙවෙනිව මිණි ගෙන් ප්‍රශ්න අසන්නට විය.

"දැන් කවද්ද පුංචි බේබි මාමණ්ඩිලාගේ ගෙදර යන්නේ?"

බෙංගාලි කෙල්ලන් 'මාමණ්ඩි ගේ ගෙදර' ගැන ඉගෙනගන්නේ කුඩා කාලයේ දී ම ය. එහෙත් අප මඳක් අලුත් පන්නයේ වූ බැවින් මෙවැනි දේ දැරියගෙන් වසන් කර තිබුණු අතර මේ ප්‍රශ්නයෙන් ඇය මඳක් වික්ෂිප්ත වූ බවක් දිස් විය. එහෙත් ඒ බවක් නොපෙන්වා ඈ උපාය නුවණින් "ඔයාත් යනවාද එහේ?" යැයි වෙළෙන්දාගෙන් ආපිට ප්‍රශ්න කළා ය.

කාබුල් වෙළෙන්දාගේ පන්තියේ මිනිසුන් අතර 'මාමණ්ඩි ගේ ගෙදර' යන පදයට යටි අරුතක් තිබිණි. ඔවුහු එය හිරේ විලංගුවේ වැටෙනවාටත් යෙදූ හ. ඔවුන් එසේ කීවේ එය තමන්ගේ කිසි වියදමක් නොමැතිව, කාබී සැපට සිටිය හැකි තැනක් යන්න අදහස් වන්න යි. ඉතින් මේ හැඩිදැඩි වෙළෙන්දා දියණිය නැගූ ප්‍රශ්නය ඒ අරුතින් වටහා ගත් බවක් පෙනිණි.

සිතින් මවාගත් පොලිස්කරුවෙක් වෙත අත මිට මොලවමින් "ආ..මාමණ්ඩි ට මම තඩිබාන්න ඉන්නේ!" යැයි ඔහු කීය. මෙය අසා ගුටි කන මාමණ්ඩියෙක් සිතින් මවාගත් මිණි මහා හඬින් සිනාසෙන්නට වූ අතර ඇගේ ඒ සිනාවට වෙළෙන්දාත් හවුල් විය.

අතීතයේදී එවැනිම සරත් කාලවලදී පැරණි රජවරු වෙනත් සතුරු රාජධානි අත්පත් කරගැනීමට යුධ වැදුණු නමුත් මම කල්කටාවේ මගේ කුඩා මුල්ලෙන් නොසෙල්වී ම මනසින් ලොව පුරා ඇවිද්දෙමි. වෙනත් රටක නමක් ඇසුණු පමණින්, මඟ තොට දී විදේශිකයෙක් දුටු පමණින් මගේ සිත සිහින ජාලයක් වියන්නට උත්සුක විය. එරට කඳු නිම්න ගැන, වනාන්තරයක් අසල කුඩා නිවහනක් ගැන, එහි මිනිසුන් ගතකළ නිදහස් නිවහල් දිවිය ගැන කතන්දර මවාගන්නට මම පුරුදු ව සිටියෙමි. සමහරවිට මේ දවල් සිහින මැවීම මා සිදුකළේ මා ගත කළ ඒකාකාරී ජීවිතය සංචාරයක අදහසින් පවා උඩු යටිකුරු වන බව දැන සිටි නිසා විය හැක. කාබුල් වෙළෙන්දා ළඟපාතක සිටින විට ඔහුගේ ගම් ප්‍රදේශයේ ශුෂ්ක කඳු පන්ති සහ ඒ අතරින් දිවෙන පටු අඩි පාරවල් වෙත මම නිරතුරුව සිතින් ගමන් කළෙමි. බඩු පොදි ඔසවා යන ඔටුවන්, අමුතු තුවක්කු සහ හෙල්ල අතින් ගත් තලප්පා බැඳි වෙළෙඳුන් තැනිතලා බිම් මතින් ගමන් කරනු මට මැවී පෙනුණි. ඒත් මෙවැනි අවස්ථා වලදී මිණි ගේ අම්මා මගේ දැහැන බිඳින්නේ 'අර මිනිහාගෙන් පරෙස්සම් වෙන්න ඕනී! යැයි ඇවිටිලි කරමිනි.

16 වන පිටට